# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව
# අත්පොත

# Postgraduate Diploma in Education Programme

# Handbook
# 2014/2015

අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය
ශාස්ත්‍ර පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**Department of Education**
**Faculty of Arts**
**University of Peradeniya**

## Vision of the University

The Vision of the University of Peradeniya is to be a centre of excellence in higher education, research and scholarship, to train competent, creative and skilled graduates to meet the social demands of a rapidly changing national and global environment.

## Mission of the Department

The mission of the Department of Education is to develop committed and competent professionals who will provide leadership in the system of education in Sri Lanka to withstand future challenges and to bringing in innovation and change

# පටුන / Contents


| | | පිටු අංක |
|---|---|---|
| | පීඨාධිපතිතුමාගේ පණිවුඩය | 04 |
| | අංශාධිපතිතුමියගේ පණිවුඩය | 05 |
| | පාඨමාලා සම්බන්ධීකාරක පණිවුඩය | 06 |
| 1. | ආචාර්ය මණ්ඩලය | 07 |
| 2. | අපේක්ෂිත ඉගෙනුම් ඵල සහ පාඨමාලා අන්තර්ගතය | 10 |
| 3.0 | විෂයමාලාව | 12 |
| 3.1 | අනිවාර්ය විෂයයන් | 12 |
| 3.2 | වෛකල්පික විෂයයන් | 14 |
| 3.3 | වරණීය විෂයයන් | 16 |
| 3.4 | අර්ඝ රහිත අනිවාර්ය විෂයයන් | 16 |
| 3.5 | ගුරු පුහුණුව | 17 |
| 3.6 | පාඨමාලාව සම්පූර්ණ කිරීම හා ඇගයීම | 18 |
| 3.7 | පාඨමාලා ඒකක ක්‍රමයට අදාල පාරිභාෂික වචන | 19 |
| 4.0 | අධ්‍යයන වර්ෂයට යෝජිත දින දර්ශනය 2014/2015 | 21 |

# පීඨාධිපතිතුමාගේ පණිවුඩය



පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය මගින් මෙහෙයවනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාව හදාරන ගුරු භවතුන් වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කරන්නේ ඉමහත් සතුටකිනි.

ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපනයේ පෙරගමන්කරු වන පේරාදෙණිය විශ්ව විද්‍යාලය ශාස්ත්‍රාභිලාෂීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය උදෙසා අඩසියවසකට වැඩි කාලයක් දායකත්වය ලබා දී තිබේ. එහිදි ශාස්ත්‍රීය මෙන්ම වෘත්තීය පුහුණු පාඨමාලා රැසක් ක්‍රියාත්මක කරමින් විශ්වවිද්‍යාලයීය අරමුණු සපුරා ගැනීම උදෙසා ශාස්ත්‍ර පීඨය ද සුවිශේෂී මෙහෙවරක යෙදී සිටි.

අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය වර්ෂ 1957 සිට මෙම විශ්වවිද්‍යාලයේ සහ ශාස්ත්‍ර පීඨයේ අනන්‍යතාව රැකගනිමින් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ උන්නතිය උදෙසා පාඨමාලා රැසක් ක්‍රියාත්මක කරමින් දායකත්වය සපයන බව ප්‍රකාශ කරන්නේ ඉතාමත් ඕනෑකමිනි.

අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සෘජුවම ශ්‍රී ලංකා පාසල් අධ්‍යාපනයේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක වන්නකි. ප්‍රථම උපාධිය සම්පූර්ණ කොට ගුරුවෘත්තීයට ප්‍රවේශවන ගුරුභවතුන් විධිමත්ව වෘත්තීයට අනුගත කිරීම මෙහි මූලික අභිලාෂය වේ.

අදාල පුහුණුව විධිමත්ව සම්පූර්ණ කළ ගුරුවරුන් තම සේවයේ මනා සාර්ථකත්වයටත්, පුළුල්ව ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ උන්නතියටත් සුවිශේෂී මෙහෙවරක් සිදුකොට ඇති බව ප්‍රත්‍යක්ෂ කරුණකි. එවන් සුවිශේෂි මෙහෙවරක කොටස්කරුවකු වීමට ඔබට ද මෙම පාඨමාලාවෙන් නිසි මග පෙන්වීමක් ලැබෙන බව මම විශ්වාස කරමි. ඔබට සුභ පතමි.

මහාචාර්ය ඒ.එම් නවරත්න බණ්ඩාර

පීඨාධිපති, ශාස්ත්‍ර පීඨය

# අංශාධිපතිතුමියගේ පණිවුඩය



පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය මගින් මෙහෙයවන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව අඩසියවසකට ආසන්න කාලයක් ශ්‍රී ලාංකේය උපාධිධාරී ගුරුවරුන්ගේ වෘත්තීය  කුසලතා සංවර්ධනයට දායකත්වය ලබා දී ඇති අතර එමගින් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට සුවිශේෂ මෙහෙවරක් සිදුකොට ඇති බව අවිවාදයෙන් පිළිගැනේ.

උපාධිධාරී ගුරුවරයෙකු වශයෙන් ගුරු වෘත්තියයට ප්‍රවේශ වන ඔබට ගුරු වෘත්තිකභාවයට අනුගත කිරීමේ මූලික පාඨමාලාව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවයි. අධ්‍යාපන කාර්යයට අදාල පොදු කුසලතා, පංතිකාමර ඉගැන්වීම හා සම්බන්ධ කුසලතා, ශිෂ්‍යයන් පිළිබඳ නිවැරදි ආකල්ප හා විශ්වාස සංවර්ධනය කිරීම වෘත්තීක පැවැත්මට උචිත චර්යා අත්පත් කිරීම මෙම පාඨමාලාව තුලින් අපේක්ෂිත ඉගෙනුම් ඵල වශයෙන් සඳහන් කල හැකිය.

මෙම පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමලාව පූර්ණකාලීන හා සති අන්ත වශයෙන් අදියර දෙකකින් ක්‍රියාත්මක වේ. පූර්ණකාලීන පාඨමාලාව සඳහා ගුරු සිසුන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තෝරා එවනු ලබන අතර සති අන්ත පාඨමාලාව සඳහා ගුරු සිසුන් තෝරා ගැනීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය මගින් සිදු කරනු ලැබේ. මෙම පාඨමාලා දෙකෙහිම විෂයමාලා අන්තර්ගතය සමාන වන අතර පූර්ණකාලීන පාඨමාලාව මාස 12ක් වන අතර සති අන්ත පාඨමාලා කාලය මාස 18කි. මෙම පාඨමාලා දෙකම සමානව සැලකේ.

පසුගිය වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමලාව සාර්ථකව අවසන් කළ ගුරු සිසුන් සංඛ්‍යාව 219 කි. වර්ෂ 2014/2015 පාඨමාලාවට තේරී පත්වූ ඔබ සැම අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය වෙනුවෙන් සතුටින් පිළිගනිමු.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමලාව හදාරන්නෙකු විසින් දැනගතයුතු මූලික කරුණු සියල්ල මෙම අත්පොතෙහි අන්තර්ගතය. එහි ඇතුලත් උපදෙස් කියවා අවබෝධ කොටගෙන පාඨමාලාව සාර්ථකව නිමා කිරීමට අදිටන් කර ගන්න. පාඨමාලා කාලය තුල ඔබගේ පෞද්ගලික වෘත්තීය සහ අධ්‍යාපනික ජීවිතය සාර්ථක කරගැනීමට අවශ්‍ය ධෛර්යය හා ශක්තිය ලැබේවායි අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය වෙනුවෙන් ශුභ ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය සුසිලා ඇම්බැක්ක
අංශාධිපති/ අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය

## පාඨමාලා සම්බන්ධීකාරක පණිවුඩය



පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය මගින් මෙහෙයවනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාවේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීමට ලැබීම සතුටකි. අංශාධිපති තුමිය ඇතුළු අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් ලැබෙන අනුග්‍රහය හා මාර්ගෝපදේශය අතිශය වැදගත් කොට සලකන අතර පාඨමාලාවෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල වෙත ගුරු සිසුන් මෙහෙයවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමේ වගකීම භාර ගනිමි.

නිර්මාපී බව හා විවේචනාත්මක චින්තනය සහිත ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතියට ගැලපෙන කුසලතා පිරිපුන් ගුරුභවතෙකු බිහි කිරීම අරමුණු කොටගත් මෙම පාඨමාලාවේ උපරිම ඵල නෙලා ගැනීම පාඨමාලාව හදාරන ඔබ සතු වගකීම වේ. ඒ සඳහා ඔබ සිදුකළ යුතු කැපකිරීම අවබෝධ කොට ගැනීම වැදගත් වේ. ඔබේ අවංක උත්සාහයට නිවැරදි මග පෙන්වීම හා අත දීම අධ්‍යයන අංශය මගින් නොඅඩුව ලැබෙනු ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතු සුවිශේෂී ඥාණ ගවේශන විභවතා ඇසුරු කරමින් ඔබගේ වෘත්තීය මෙන්ම පෞද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීමට වාසනාව, ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනය කරමි.

ප්‍රභාත් ඒකනායක
පාඨමාලා සම්බන්ධීකාරක
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාව

## 1. ආචාර්ය මණ්ඩලය

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

- ආචාර්ය සුසිලා ඇම්බැක්ක මිය (අංශාධිපතිනිය)

- මහාචාර්ය ප්‍රසාද් සේතුංග මයා
  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
  *(දර්ශනපති පාඨමාලාව සම්බන්ධීකාරක)*

- ආචාර්ය සුහාෂිණී විජේසුන්දර මෙනවිය
  ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී

- ආචාර්ය පුෂ්පා විතාරණ මෙනෙවිය
  ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී
  *පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා ( පූර්ණ කාලීන )පාඨමාලාව සම්බන්ධීකාරක*

- ප්‍රභාත් ඒකනායක මයා
  කථිකාචාර්ය
  *පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත)පාඨමාලාව සම්බන්ධීකාරක*

- වෝල්ටර් සෙනවිරත්න මයා
  කථිකාචාර්ය
  *ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සති අන්ත)පාඨමාලාව සම්බන්ධීකාරක (අධ්‍යයන නිවාඩු)*

- ආචාර්ය එච්. එම්. සමරකෝන්බණ්ඩා මයා
  කථිකාචාර්ය
  *ප්‍රථම උපාධි මට්ටමේ අධ්‍යාපන පාඨමාලාවන්හි සම්බන්ධීකාරක*

- ආචාර්ය සකුන්තලා යටිගම්මන ඒකනායක මිය
  කථිකාචාරිණී
  *අධ්‍යාපනපති පාඨමාලාව සම්බන්ධීකාරක*

## 1.1 අනධ්‍යයන කාර්ය මණ්ඩලය

- මේනකා උදය කුමාරි මෙනවිය
- P.W. G. විජේන්ද්‍ර මයා
- R. ගිහාන් උදලාගම මයා
- S.M. S. සමරකෝන් මිය
- U.W.M ධනංජය මයා
- L. රාජරත්න මයා

## 1.2 Staff of the Department of Education, University of Peradeniya

**Academic Staff**

| | |
|---|---|
| **Head** | |
| Dr .E.K.S.K. Embekke | B.Sc. (Hons) (Public Administration) (Sri Jayawardenapura); Postgraduate Diploma Education, M. Phil in Education, PhD in Education (University of Peradeniya). |
| Prof. S.M.P.W.K Sethunga | B.A. (Ed) M.Ed. (University of Kyoto, Japan); PhD in Education (University of Tsukuba, Japan). |
| Senior Lecturer | |
| Dr.S. D. K. Wijesundera | B.Sc. (Hons) (Sri Jayawardenapura); Postgraduate Diploma (Educational and Psychological Assessment) Colombo; M. Sc. in Education Management and Administration (Moray House College, UK). MSc in Applied Psychology (Colombo), PhD in Education (University of Nottingham, UK). |
| Senior Lecturer | |
| Dr .P.R.K.A Vitharana | B.Sc, (Open University of Sri Lanka), Postgraduate Diploma in Education (Peradeniya), English Trained, Diploma in Advanced English (Colombo), M.Sc. in Science Education, (Peradeniya) PhD in Science Education (Peradeniya). |
| Lecturer | |
| Mr.E.M.P.C.S Ekanayake | B. A. (Hons), Postgraduate Diploma in Education, (University of Peradeniya), Diploma in Teaching (NIE), Teacher Training (DFID, UK) M. Ed (University of Sussex, UK). MPhil in Education, University of Colombo. |
| Lecturer | |
| Mr.K.S.H.M.V.W.W. Senavirathne | B.Sc, Postgraduate Diploma in Education, M.Phil in Education (University of Peradeniya) |
| Lecturer | |
| Dr.H.M.Samarakoon Banda | B.Com (Hons), Postgraduate Diploma in Education, (University of Peradeniya) Diploma in English (University of Kelaniya ) M.Phil in Education (University of Peradeniya), PhD in Education (University of Peradeniya) |
| Lecturer | |
| Dr. T.M.S. S.K. Yatigammana Ekanayake | B.Sc in Bio Sciences (Peradeniya), PGDE (Peradeniya), M.Sc in Science Education (Peradeniya), Postgraduate Diploma in IT Education (Peradeniya), Postgraduate Diploma in Research Methods (University of Bristol, UK), PhD in Educational Technology (University of Bristol, UK) |

## Non-academic Staff members

Ms. Menaka Udaya Kumari

Mr. P. W. G. Wijendrahamy

Mrs. S. M. S. Samarakoon

Mr. R. Gihan Udalagama

Mr. Dhananjaya Kumarasinghe

Mr. L. Rajarathna

## 2.0. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ ගුරු පුහුණුවෙන් හා කාර්ය මූලික පර්යේෂණයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල

පාඨමාලාව සාර්ථකව නිම කිරීමේදී ගුරු ශිෂ්‍යයන් තුළ පහත සඳහන් **ඉගෙනුම් ඵල** සාධනය විය යුතු වේ.

1. අධ්‍යාපන කාර්යයට අදාළ පොදු කුසලතා සමූහය (Generic Skills for Education)
2. ඉගැන්වීම හා සම්බන්ධ කුසලතා
   (classroom teaching skills)
3. වෘත්තික පැවැත්මට අයත් මතු දැක්වෙන චර්යාවන් අත්පත් කරගෙන තිබීම (Professional behaviors)
4. නිවැරදි ආකල්ප හා විශ්වාස සංවර්ධන කරගෙන තිබීම

**1. අධ්‍යාපන කාර්යයට අදාළ පොදු කුසලතා සමූහය (Generic Skills for Education)**

- සන්නිවේදන කුසලතා
- ඉගැන්වීම් කාර්යය සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය යොදාගැනීමේ කුසලතා
- ඉගෙනීම, විචාරාත්මක චින්තනය සහ ගැටළු විසඳීම පිළිබඳ කුසලතා
- පාසල් සිසුන්ට දෙමාපියන්ට, සෙසු ගුරුවරුන්ට විදුහල්පතිවරුන් හා නිලධාරීන් සමග සාමූහිකව වැඩ කිරීමට අවශ්‍ය වන අන්තර් පුද්ගල කුසලතා
- ස්ව-කළමනාකරණය හා කාල කළමනාකරණය පිළිබඳ කුසලතා

**2. ඉගැන්වීම හා සම්බන්ධ මතු දැක්වෙන (Classroom teaching skills) කුසලතා සංවර්ධනය වී තිබිය යුතුවේ.**

- ඉගෙනුම් අත්දැකීම් හා ඉගැන්වීම් කාර්යය සැලසුම් කිරීම
- ඵලදායී ලෙස ඉගැන්වීමේ (Instructional skills) කුසලතා
- ශිෂ්‍ය ඉගෙනුම සඳහා සුදුසු ඵලදායී ඉගෙනුම් වාතාවරණයක් නිර්මාණය කොට පවත්වා ගැනීමේ කුසලතා
- පන්තිකාමර කළමනාකරණ කුසලතා
- ශිෂ්‍ය චර්යාවන් කළමනාකරණය කිරීමේ කුසලතා
- පන්තියේ ඉඩකඩ කළමනාකරණය කරගැනීමේ කුසලතා
- ශිෂ්‍යයින්ගේ සාධනය ඇගයීම හා ප්‍රතිපෝෂණ ලබාදීමේ කුසලතා
- ඉගෙනුම් දුර්වලතා හඳුනාගැනීම හා ප්‍රතිකාරී ක්‍රියාමාර්ග යෙදීමේ කුසලතා
- ප්‍රත්‍යවේක්ෂණයේ යෙදෙන ව්‍යවහාරිකයකු වීමට අවශ්‍ය කුසලතා (Skills necessary to be a reflective practitioner)
- පාසලේ කටයුතුවලට දායක වීම
- වෘත්තික දැනුම වර්ධනය කරගැනීම
- වෘත්තිකභාවය ප්‍රදර්ශනය කිරීම (උදා: සිසුනට හා ඔවුන්ගේ දෙමාපියන්ට මගපෙන්වන්නකු ලෙස ක්‍රියාකිරීම)

**3. නිවැරදි ආකල්ප හා විශ්වාස සංවර්ධන කරගෙන තිබීම**

- සෑම ශිෂ්‍යයකු පිළිබඳවම ධනාත්මක අපේක්ෂා ඇතිකර ගැනීම (Positive expectations)
- ශිෂ්‍යයින් පිළිගැනීම හා ඔවුන් විශ්වාස කිරීමේ ආකල්ප (An attitude of acceptance and trust)

**4. වෘත්තික පැවැත්මට අයත් මතු දැක්වෙන චර්යාවන් අත්පත් කරගෙන තිබීම**

- ඉගෙනීම හා ඉගැන්වීම පිළිබඳ ඇල්ම ප්‍රදර්ශනය කිරීම
- සෑම ශිෂ්‍යයකුටම සමානව හා සාධාරණව සැලකීම
  සහයෝගයෙන් ක්‍රියාකිරීමට හා අධ්‍යාපනික කාර්යයේ නියැලුණු ප්‍රජාවට හෝ කණ්ඩායමට අයත් අයකු ලෙස ක්‍රියාකිරීම (පාසල තුළ තමන්ගේ භූමිකාව හඳුනාගෙන ක්‍රියාත්මක වීම)

## Learning outcomes and the Course components of Postgraduate Diploma in Education course

| Intended learning Outcomes | Related Course components |
|---|---|
| 1. Students should have developed knowledge and understanding of education theory and practices | Six compulsory courses, optional and electives |
| 2. Students should have learned how the above knowledge and understanding can be applied in teaching learning and other situations in diverse educational settings. | Discussions, individual and group activities, teaching practice and action research project |
| 3. acquired a range of **generic skills for education** (Communication skills, ICT skills, especially in utilizing ICT in instruction, critical thinking and problem solving skills, interpersonal skills necessary for working collaboratively with children, parents, peers and superiors, skills necessary for managing self and time. | Classroom discussions, individual and group presentations, organizing and participating in co - curricular activities and engaging in project work and research activities. |
| students (in addition to the above 1 to 3) should have;<br><br>4. developed a set of **classroom teaching related skills** which (include),<br>• Planning instruction and designing learning experiences<br>• Creating and maintaining effective environment for student learning.<br>• Managing the classroom<br>• Managing student behaviour<br>• Organizing classroom space,<br>• Assessing student learning and providing feedback<br>• Skills necessary to be a reflective practitioner.<br>• Identifying learning difficulties and remediation.<br>• Effective instructional skills | Group activities in classroom, simulations of classroom teaching, demonstration lessons using school children, and supervised teaching practice in schools for ten weeks. |
| 5. Acquired **professional behaviour** which include<br>• Critical reflection (thoughtful consideration of one's own actions and their effects)<br>• Maintaining accurate records<br>• Communicating with families and parents<br>• Contributing to the school / organization<br>• Grow as professionals<br>• Show professionalism (Eg: Serve as advocates to students and families) | Action Research project and teaching practice |
| **6.** Developed **dispositions**<br>• to have positive expectations for all students.<br>• to have attitude of acceptance and trust<br>• to demonstrate love of teaching and learning<br>• to treat all students equally and fairly<br>• Willingness to collaborate and to see themselves as part of an educational team and community | Teaching practice<br>Action research<br>Co-curricular activities |

## 3.0. Postgraduate Diploma in Education (Week-End) Course 2014/2015

### විෂයමාලාව

| | | |
|---|---|---|
| 1. | අනිවාර්ය විෂයයන් | 07යි |
| 2. | වෛකල්පික විෂයයන් | 14යි |
| 3. | වරණීය විෂයයන් | 10යි |
| 4. | අර්ඝ රහිත අනිවාර්ය විෂයන් | 04යි |

### Course Structure

| | |
|---|---|
| 1. Compulsory Courses | 07 |
| 2. Optional Courses | 14 |
| 3. Electives | 10 |
| 4. Non-Credit Compulsory courses | 04 |

## 3.1 අනිවාර්ය විෂයයන්

| | | | |
|---|---|---|---|
| 1. | PDE 501 | අධ්‍යාපන පරිපාලනය හා ප්‍රතිපත්ති | පැය 45 යී – අර්ඝ 3යී |
| 2. | PDE 502 | අධ්‍යාපනය හා සමාජ විද්‍යාව | පැය 45 යී – අර්ඝ 3යී |
| 3. | PDE 503 | තුලනාත්මක හා ජාත්‍යන්තර අධ්‍යාපනය | පැය 45 යී – අර්ඝ 3යී |
| 4. | PDE 504 | අධ්‍යාපනික මිණුම් හා ඇගයුම් | පැය 45 යී – අර්ඝ 3යී |
| 5. | PDE 505 | අධ්‍යාපනික හා සංවර්ධන මනෝ විද්‍යාව | පැය 45 යී – අර්ඝ 3යී |
| 6. | PDE 506 | දර්ශනය හා අධ්‍යාපන මූලධර්ම | පැය 45 යී – අර්ඝ 3යී |
| 7. | PDE 507 | ඉගැන්වීම් ක්‍රම විද්‍යාව | |
| | | 1. සාමාන්‍ය ඉගැන්වීම් ක්‍රම | පැය 30 යී – අර්ඝ 2යී |
| | | 2. විශේෂ ඉගැන්වීම් ක්‍රම | පැය 15 X විෂයයන් 2යි අර්ඝ 2යී |

අනිවාර්ය විෂයයන් සෑම ගුරු සිසු සිසුවියක විසින්ම අනිවාර්යයෙන් අධ්‍යයනය කළ යුතුය

## Compulsory Courses

Compulsory subjects have to be followed by all the students.

| | |
|---|---|
| **PDE 501** Education Administration and Policy Studies | 45 hours - 3 credits |
| **PDE 502** Sociology and Education | 45 hours - 3 credits |
| **PDE 503** Comparative and International Education | 45 hours - 3 credits |
| **PDE 504** Educational Measurement and Evaluation | 45 hours - 3 credits |
| **PDE 505** Educational and Developmental Psychology | 45 hours - 3 credits |
| **PDE 506** Philosophy and Principles of Education | 45 hours - 3 credits |
| **PDE 507** Instructional Methodology | (4 credit points) |
| 1. General Methods of teaching | 30 hours – 2 credits |
| 2. Special Methods of teaching | 15 hours x 2 subjects – 2 credits |

## (ආ) විශේෂ ක්‍රම විද්‍යාව විෂයයන් 15 කි.

ඉහත PDE **507** ඉගැන්වීම් ක්‍රම යටතේ 1. සාමාන්‍ය ඉගැන්වීම් ක්‍රම විෂය අනිවාර්ය වන අතර 2. විශේෂ ඉගැන්වීම් ක්‍රම සඳහා පහත විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් 2ක් තෝරාගත යුතුය.

PDE 508 විද්‍යාව හා තාක්ෂණය
PDE 509 ගණිතය
PDE 510 ජීව විද්‍යාව
PDE 511 සිංහල
PDE 513 ඉතිහාසය
PDE 514 බුද්ධාගම
PDE 515 ආර්ථික විද්‍යාව
PDE 516 ප්‍රාථමික ඉගැන්වීම් ක්‍රම
PDE 517 ව්‍යාපාර අධ්‍යයනය හා ගණකාධිකරණය
PDE 518 සෞන්දර්යය හා සම්භාවික කලා
PDE 548 පුරවැසි අධ්‍යාපනය
PDE 549 සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
PDE 550 ඉංග්‍රීසි
PDE 551 ජීවන කුසලතා
PDE 552 භූගෝල විද්‍යාව
PDE 553 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

There are 2 sections under instructional methodology. Section 1 is Compulsory. From section 2 students have to select 2 courses among the following subjects.

**PDE 508** Science and Technology
**PDE 509** Mathematics
**PDE 510** Biological Science
**PDE 511** Sinhala
**PDE 513** History
**PDE 514** Buddhism
**PDE 515** Economics
**PDE 516** Primary Methods
**PDE 517** Business Studies and Accounting
**PDE 518** Aesthetic and Fine- Arts
**PDE 548** Citizenship Studies
**PDE 549** Health and Physical Education
**PDE 550** English
**PDE 551** Life Skills
**PDE 552** Geography
**PDE 553** Information and communication Technology

## 3.2 වෛකල්පික විෂයයන්

වෛකල්පික විෂයයන් 14කි. (මෙම විෂය කාණ්ඩ අතුරින් එක් කාණ්ඩයකින් එක් විෂයය බැගින් විෂයයන් 04ක් විභාගය සඳහා තෝරාගත යුතුය)

**කාණ්ඩ 1**

| | | |
|---|---|---|
| PDE 519 | පාසල් ඉගෙනුම් කළමනාකරණය | පැය 15 – අර්ඝ 1 |
| PDE 520 | ගුරු වෘත්තීය සංවර්ධනය හා ඇගයීම | පැය 15 – අර්ඝ 1 |

**කාණ්ඩ 2**

| | | |
|---|---|---|
| PDE 521 | පාසල් සමාජ විද්‍යාව | පැය 15 – අර්ඝ 1 |
| PDE 522 | සමාජ ස්ථරායනය, සමාජ ගැටළු හා අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |

**කාණ්ඩ 3**

| | | |
|---|---|---|
| PDE 523 | අධ්‍යාපනය හා ජාතීන්ගේ සංවර්ධනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 524 | ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික සංවර්ධනය | පැය 15 – අර්ඝ 1 |

**කාණ්ඩ 4**

| | | |
|---|---|---|
| PDE 525 | අධ්‍යාපන ඇගයීම් ක්‍රියාවලි, ආකෘති හා ක්‍රම | පැය 15 – අර්ඝ 1 |
| PDE 526 | අධ්‍යාපනික මනෝවිද්‍යාත්මක ඇගයීම උපදේශනය හා මාර්ගෝපදේශනය | පැය 15 – අර්ඝ 1 |

**කාණ්ඩ 5**

| | | |
|---|---|---|
| PDE 527 | තරුණ හා ළමා අධ්‍යාපනික මනෝවිද්‍යාත්මක උපදේශනය හා මාර්ගෝපදේශනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 528 | මනෝවිද්‍යාත්මක සංවර්ධනය ආශ්‍රිත අධ්‍යාපනික හා සමාජීය සන්දර්භය | පැය 15 – අර්ඝ 1 |

**කාණ්ඩ 6**

| | | |
|---|---|---|
| PDE 529 | නූතන හා පශ්චාත් නූතන නව්‍යවාදී සහ සමාජ චින්තනය සහ අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 530 | පෙරදිග හා අපරදිග අධ්‍යාපන දර්ශනය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය | පැය 15 – අර්ඝ 1 |

**කාණ්ඩ 7**

| | | |
|---|---|---|
| PDE 531 | නිර්මාණකත්වය හා විවේචනාත්මක චින්තනය සඳහා විෂයමාලාව හා ඉගැන්වීම් ක්‍රම සැලසුම්කරණය | පැය 15 – අර්ඝ 1 |
| PDE 532 | විෂයමාලාව හා ඉගැන්වීම් සම්බන්ධව ඇති කරුණු ඇගයීම | පැය 15 – අර්ඝ 1 |

## Students have to select 04 optional subjects from each group among the following 7 groups.

**Group 1**

| | | |
|---|---|---|
| **PDE 519** | Managing learning in schools | 15 hours - 1 credit |
| **PDE 520** | Professional development and teacher appraisal | 15 hours - 1 credit |

**Group 2**

| | | |
|---|---|---|
| **PDE 521** | Sociology of schools | 15 hours - 1 credit |
| **PDE 522** | Social stratification, social problems and education. | 15 hours - 1 credit |

**Group 3**

| | | |
|---|---|---|
| **PDE 523** | Education and the development of nations. | 15 hours - 1 credit |
| **PDE 524** | Development of education in Sri Lanka. | 15 hours - 1 credit |

**Group 4**

| | | |
|---|---|---|
| **PDE 525** | Educational evaluation procedures, models and methods. | 15 hours - 1 credit |
| **PDE 526** | Educational and psychological testing | 15 hours - 1 credit |

**Group 5**

| | | |
|---|---|---|
| **PDE 527** | Principles and Methods of Educational and Psychological Guidance and Counseling of Children and Youth. | 15 hours - 1 credit |
| **PDE 528** | Educational and social context of psychological Development | 15 hours - 1 credit |

**Group 6**

| | | |
|---|---|---|
| **PDE 529** | Modernity and Post Modernity in social thought and Education | 15 hours - 1 credit |
| **PDE 530** | A comparative study of educational thought in the West and East | 15 hours - 1 credit |

**Group 7**

| | | |
|---|---|---|
| **PDE 531** | Designing curriculum and instruction for creativity, and critical thinking. | 15 hours - 1 credit |
| **PDE 532** | Evaluation issues in curriculum and teaching. | 15 hours - 1 credit |

## 3.3 වරණීය විෂයයන්

වරණීය විෂයයන් (මෙම විෂයයන්ගෙන් විෂයයන් 02ක් විභාගය සඳහා තෝරාගත යුතුය)

| | | |
|---|---|---|
| PDE 533 | පරිසර අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 534 | උසස් සංඛ්‍යානය | පැය 15 – අර්ඝ 1 |
| PDE 535 | විශේෂ අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 536 | ජනගහන අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 537 | සදාචාර හා සාම අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 538 | යාව ජීව අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 539 | පූර්ව ළමා අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 540 | පුම්තිරි බව හා අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 541 | විෂයමාලා සංවර්ධනය අධ්‍යාපනය | පැය 15 – අර්ඝ 1 |
| PDE 542 | අධ්‍යාපනික තාක්ෂණය | පැය 15 – අර්ඝ 1 |

## Electives (Each student have to select at least 2 subjects)

| | |
|---|---|
| **PDE 533** Environmental education | 15 hours - 1 credit |
| **PDE 534** Advanced statistics | 15 hours - 1 credit |
| **PDE 535** Special education | 15 hours - 1 credit |
| **PDE 536** Population education | 15 hours - 1 credit |
| **PDE 537** Moral and Peace education | 15 hours - 1 credit |
| **PDE 538** Lifelong education | 15 hours - 1 credit |
| **PDE 539** Early childhood education | 15 hours - 1 credit |
| **PDE 540** Gender and education | 15 hours - 1 credit |
| **PDE 541** Curriculum development | 15 hours - 1 credit |
| **PDE 542** Educational technology | 15 hours - 1 credit |

## 3.4 අර්ඝ රහිත අනිවාර්ය විෂයයන්

| | |
|---|---|
| PDE 544 | අධ්‍යාපන පර්යේෂණ ක්‍රම විද්‍යාව |
| PDE 545 | මූලික පරිගණක දැනුම |
| PDE 546 | මූලික ඉංග්‍රීසි අධ්‍යාපනය |
| PDE 547 | අර්ධ පර්යේෂණ නිබන්ධනය |

මෙම විෂයයන් අර්ඝයන් රහිත වුවද සමත් විය යුතුය.

උපාධියක් සඳහා අවශ්‍ය අවම පාඨමාලා සංඛ්‍යාවට අතිරේකව ශිෂ්‍යයකු විසින් හැදැරිය හැකි පාඨමාලාවන් මීට අයත් වේ. එහෙත් අර්ඝ රහිත පාඨමාලාවන්ට හිමි වූ ශ්‍රේණීන්, ශ්‍රේණි ලක්ෂ්‍ය සමාන්‍ය(GPA) ගණනය කිරීමේදී සලකණු ලබන්නේ නැත.

## Non-credit compulsory courses

PDE 544 – Research in Education
PDE 545 – Basic Computing
PDE 546 – Basics in English Language
PDE 547 – Part-Dissertation

These courses are compulsory and are offered on a pass/ fail basis and carry no credit points.

This includes courses a student needs to follow except minimum number of courses required for a degree: The grades obtained for non-credit courses are not considered in calculating Grade Point Average (GPA).

## 3.5 PDE 543 ගුරු පුහුණුව

ගුරු පුහුණුව මෙම පාඨමාලාවේ හරය ලෙස හැඳින්විය හැකිය. ගුරු පුහුණු අවධිය සති 10කින් සමන්විත වන අතර විශ්වවිද්‍යාලයට ආසන්න පාසලකදී එය සිදු කෙරේ. මෙම සති 10ක කාලය තුල පාඩම් සටහන් 100ක් ලියා සම්පූර්ණ කළ යුතුය අතර අධීක්ෂකවරු දෙදෙනෙක් විසින් පාඩම් 5ක් අධීක්ෂණය කර ඇගයීමට ලක් කෙරේ. නිශ්චිත කාලසීමාව තුල අදාල ගුරු පුහුණුව නිම කිරීම ගුරු සිසුන්ගේ වගකීමක් වන අතර එසේ අපොහොසත් වන සිසුන් ඊළඟ පාඨමාලාවේ ගුරු පුහුණු කාලය තුල සම්පූර්ණ කළ යුතුය. ඒ සඳහා විධිමත් අවසරයක් ලබා වෛද්‍ය සහතික හෝ පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ගුරු පුහුණුවට පෙර ප්‍රායෝගික වැඩමුළු පැවැත්වේ. ප්‍රදර්ශක පාඩම් ගුරු පුහුණු කාලය අතරතුර සිදු කෙරේ.

## PDE 543 Teaching Practice 60 hours - 4 credits

Teaching Practice is a compulsory component of the course. Students will be assigned to a few selected schools within the vicinity of the University. They are expected to teach 10 hours per week for 10 weeks under the guidance and supervision of two supervisors appointed by the Department.
Demonstration lessons also carried out during the period of Teaching Practice under the guidance of the staff. They will be evaluated by two examiners. Students who failed to fulfill the Teaching Practice componant within the given period of time shall complete within the next available time (Medical Certificate or relevant evidence must be provided). Workshops will be held prior to Teaching Practice.

**PDE 547 අර්ධ පර්යේෂණ නිබන්ධනය**

ගුරු පුහුණුව පැවැත්වෙන කාලය තුළදී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාලව තමන් විසින් හඳුනාගත් ගැටළුවකට විසඳුම් ලබාදීමේ පරමාර්ථයෙන් කාර්ය මූලික පර්යේෂණයක් ආචාර්යවරයෙකුගේ අධීක්ෂණය මත සම්පූර්ණ කල යුතුය. මෙම නිබන්ධනය වචන 15000-20000 අතර විය යුතුය. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 50ක් ගත යුතු අතර පාඨමාලාව සමත්වීම සඳහා එය අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතුය

## PDE 547 – Part-dissertation

Students have to submit a part-dissertation of 15000 to 20000 words based on an action research conducted by them during the period of teaching practice under the guidance of supervisor. Part - dissertation is a compulsory component of the course and students have to score 50 marks or above for a pass.

## 3.6. පාඨමාලාව සම්පූර්ණ කිරීම හා ඇගයීම

ඉහත තෝරාගත් විෂයයන් ඇගයීම සඳහා සන්තතික ඇගයීම භාවිත කරනු ලැබේ. ලකුණු ලැබෙන ආකාරය

I. පැවරුම් 20 %
II. අර්ධ සමාසික පරීක්ෂණ 20 %
III. සමාසික අවසාන පරීක්ෂණය 60 %

ඉහත I , II, වෙනුවට නිබන්ධන, පැමිණීම, පංති කාමර පරීක්ෂණ ආදී ක්‍රම යොදා ලකුණු පැවරීමට ආචාර්යවරයාට නිදහස ඇත.

පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධයෙන් පහත ප්‍රතිඵල පිරිනමනු ලැබේ.

| G.P.A | Grade |
|---|---|
| 2.00 - 2.299 | සාමාන්‍ය සාමාර්ථය |
| 3.00 - 3.699 | සම්මාන සාමාර්ථය |
| 3.70 හෝ ඊට ඉහළ | විශිෂ්ට සාමාර්ථය |

ඉහත G.P.A. අගයයන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ M.Ed පාඨමාලාව හැදෑරීමට හෝ වෙනත් විශ්වවිද්‍යාලවල උසස් උපාධි පාඨමාලා හැදෑරීමේදී සළකා බැලීම සිදු කෙරේ.

| G.P.A | Grade |
|---|---|
| 2.0 to 2.99 | ordinary pass |
| 3.0 to 3.699 | merit pass |
| 3.7 or above | distinction pass |

ඒ ඒ විෂයයන්ගෙන් අවම වශයෙන් C ශ්‍රේණිය ලබාගත නොහැකි වුවහොත් එම විෂයයට නැවත ඉදිරිපත් කරන අවස්ථාවකදී පෙනී සිටිය යුතුවේ. එක් විෂයකින් නැවත පෙනී සිටීමට අවසර ලැබෙනුයේ තුන් වරක් පමණි. අසමත් වූ විෂයයට අදාල පැවරුම් ද ඉදිරිපත් කළ යුතු අතර, අර්ධ සමාසික පරීක්ෂණයට ද පෙනී සිටිය යුතුවේ.

## 3.7. පාඨමාලා ඒකක ක්‍රමයට අදාල පාරිභාෂික වචන

### සමාසිකය (Semester) යනු කුමක්ද?

සමාසිකය යනු අධ්‍යයන වාරයයි. සාමාන්‍යයෙන් වර්ෂයකට සමාසික දෙකක් ඇත. එක් සමාසිකයක් සාමාන්‍යයෙන් සති 15 ක අධ්‍යයන කාලයකි.

### පාඨමාලා ඒකකයක් (Course Unit) යනු කවරේද?

සමාසිකයකදී සම්පූර්ණ කළයුතු පාඨමාලාවක් පාඨමාලා ඒකකයක් ලෙස සැලකේ. පාඨමාලාව හා පාඨමාලා ඒකකය යන වචන සමානාර්ථව භාවිත වෙයි.

### Course Unit

A complete course is taught within a semester, lasting 15 weeks, with three contact hours per week. “Course Unit” is used synonymously with “Course”.

### අර්ඝයක් (Credit) යනු කුමක්ද?

අර්ඝයක් යනු පාඨමාලාවක වටිනාකම මනින ඒකකයක් ලෙස සැලකිය හැකිය. එක් අර්ඝයක් යනු පැය 15 ක දේශන කාලයකි.

### Credit

The abstract value is assigned to a course on the basis of contact hours per week. Thus a three credit course will have three contact hours per week. “Credit hour” and “Credit” are used interchangeably.

### පාඨමාලා ලක්ෂ්‍ය රාමුව – Course Grade Guide

| Marks | Grade | Minimum Grade Point | Comments |
|---|---|---|---|
| 100-80 | A | 4 | Superior |
| 79-70 | A- | 3.7 | |
| 69-65 | B+ | 3.3 | Good |
| 64-60 | B | 3.0 | |
| 59-55 | B- | 2.7 | |
| 54-50 | C+ | 2.3 | Pass |
| 49-40 | C | 2.0 | |
| 39-30 | D | 1.0 | Fail |
| 29-0 | E | 0 | |

පාඨමාලාවකදී ශිෂ්‍යයකුගේ ශාස්ත්‍රීය නිපුණතාව පෙන්නුම් කරන්නේ ශ්‍රේණි ලක්ෂ්‍යයෙනි. පාඨමාලාවක් අවසානයේ දී ශිෂ්‍යයකු විසින් හිමි කරගනු ලබන ලකුණු ප්‍රමාණය (0-100) මත එය රඳා පවතී. ලැබූ ලකුණු ප්‍රමාණය ජාත්‍යන්තර පරිමාණයක් වන 0-4 කාර්යශූරතා මිම්ම තුලින් මනිනු ලබන අතර, ශ්‍රේණි ලක්ෂයෙහි 4.00 වැන්න විශිෂ්ටතාව දක්වන අතර 2.0 ට වඩා අඩුවීම අසමත් බවත් සලකුණු කරයි.

Candidates who fail to obtain at least a grade of "C" in a particular component has to repeat the subject when it is offered next the maximum grade that can be obtained in a repeat examination is "C".

## ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍ය (G.P.A.) ගණනය කරන්නේ කෙසේද?

ශිෂයෙකු විසින් ලබාගන්නා ලද සියලු ශ්‍රේණි ලක්ෂයන් (Grade Point) එයට අදාල අර්ඝයන් (Credit) වලින් ගුණකර, එහි එකතුව අර්ඝයන්ගේ එකතුවෙන් බෙදීමෙන් ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍ය (G.P.A) ලබා ගැනීම සිදු කෙරේ.

The final grade (Grade point average -GPA) will be a weighted average of the number of credits of the subject and the grade point. The calculation of GPA will be based on the following formula.

යොදා ගන්නා සමීකරණය.

$$G.P.A = \frac{\sum c_i \times g_i}{\sum c_i}$$

Where ci is the number of credits of the 1st subject and gi is the grade point obtained 1st subject.